THE CENTER FOR JUSTICE & ACCOUNTABILITY
Bringing Human Rights Abusers To Justice.

# වික්‍රමතුංග V. රාජපක්ෂ

## නඩුව සම්බන්ධයෙන්
## නිතරම අසන ප්‍රශ්න (FAQs)
## සහ ඒවාට පිළිතුරු
## පහත සඳහන් වී ඇත

### මෙම නඩුව පැවරුවේ ඇයි?

දස වසරක් පුරා, ඇයගේ පියාගේ ඝාතිකයන් ට එරෙහිව අහිම්සා වික්‍රමතුංග යුක්තිය සොයා ඇත. ලංකාවේ විමර්ශන නිලධාරීන් විසින් ගනු ලබන වෑයම ඉමහත් වන නමුත්, ලසන්තගේ ඝාතනය සම්බන්ධව කිසිවෙකුට තවමත් නඩු පවරා නැත. මේ හේතු නිසා අහිම්සා සහ යුක්තිය සහ වගවීම සඳහා මධ්‍යස්ථානය [Center for Justice and Accountability] ඇමෙරිකානු එක්සත් ජනපදයේ මෙම සිවිල් නඩුව පැවරීමට තීරණය කළෙමු. මෙම නඩුව හේතුවෙන් කිසිවෙකු සිර දඬුවමකට ලක් නොවන නමුත්, එතුලින් ඇගේ පියාගේ ඝාතනය නඩුව අධිකරණයක් ඉදිරියට ගෙන ඒමටද, එම ඝාතනයට ගෝඨාභය රාජපක්ෂ කෙතරම් දුරට වග කිව යුතු දැයි ස්වාධීන විනිශ්චකාරයකු විසින් තීරණය කිරීමටද අහිම්සා වික්‍රමතුංග ට ඉඩ කඩ සැකසෙනු ඇත.

### මෙම නඩුව පවරා ඇත්තේ කොහෙද ?

නඩුව පවරා ඇත්තේ ලොස් ඇන්ජලීස්, කැලිෆෝර්නියා මධ්‍යම දිස්ත්‍රික්කයට අයත් US දිස්ත්‍රික්ක අධිකරණයේදීය.

### මෙම නඩුවේ චූදිතයා ලෙස නම් කල ඇති තැනැත්තා ට, නඩුව පිලිබඳ ව දැනුම් දී ඇත්ද?

ඔව්. නඩුවේ විධිමත් දැනුම් දීමක් චූදිතයා වෙත පුද්ගලිකව භාර දී ඇති අතර, එම භාර දීම සිදු වූයේ අප්‍රේල් 7, 2019 වන දින ලොස් ඇන්ජලීස් ප්‍රාන්තයේ මොන්ට්‍රොස්, කැලිෆෝර්නියා හි දී ය. එම නොතිසි භාර දුන්නේ IDEAL INVESTIGATIONS ආයතනයේ පුද්ගලික විමර්ශකයකු විසිනි. ඒ සඳහා Mintz Group ද සහය දැක්වුවේය.

### ගොනු කර ඇති නඩුවේ නගන චෝදනා මොනවද?

මෙම නඩුවේ චෝදනා කරන්නේ ලසන්ත වික්‍රමතුංගගේ අනීතික ඝාතනයට සහ රාජපක්ෂ ආණ්ඩුව විවේචනයට ලක් කල අනෙකුත් මාධ්‍යවේදීන් පැහැර ගිය හා ක්‍රමානුකූල ඉලක්ක කිරීමට ගෝඨාභය රාජපක්ෂ සම්බන්ධ බවය.

## මෙම නඩුවට අදාළ නීති රාමුව කුමක්ද? මෙම චෝදනා පවරා ඇත්තේ කුමන නීතියක් යටතේ ද?

මෙම නඩුව පවරා ඇත්තේ ඇමරිකාවේ ෆෙදෙරල් නීති දෙකක් වන US විදෙස් අලාභහානි සිදු කිරීමේ වැරදි පිලිබඳ පනත සහ US වධ හිංසා වලට ලක්වුණු වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත යටතේය.

1991 නීතියක් බවට පත් වුනු US වධ හිංසා වලට ලක්වුණු වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත ඇමරිකාවේ පුරවැසියන්ට හා පුරවැසියන් නොවන අයට විදෙස් රටවල සිදුවූ අනීතික ඝාතන සහ වධ හිංසා වලට එරෙහිව නඩු පැවරීමේ අයිතිය තහවුරු කරනු ඇත. විදෙස් වදහිංසා පනත වගේම මෙම නීතිය ද තුලින් එම මොහොතේ ඇමෙරිකාවේ හෝ ඇමරිකානු අධිකරණ බල ප්‍රදේශයක් තුලදී අපරාධ නඩු නොවන සිවිල් නඩු පැවරීමට හැකි වනු ඇත. නීතියට පත් වුන දින සිට, විදෙස් රටවල හමුදා නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් හා පැරා මිලිටරි නිලධාරීන් මානව හිමිකම් උල්ලංගනය කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමට ඇමෙරිකානු වධ හිංසා වලට ලක්වුණු වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත යටතේ සිදු වී ඇත.

## දැන් චූදිතයා ගත යුතු මීළඟ පියවර කුමක්ද?

නොතීසි භාර දීමෙන් පසුව, නඩුවේ අඩංගු චෝදනා වලට පිළිතුරු දීමට චූදිතය ට සති තුනක් ඇත. එම පිළිතුරෙන් නඩුවේ ගොනු කර ඇති චෝදනා පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සහ නඩුව අස් කර ගැනීමට මෝසමක් ඉදිරිපත් කල හැකිය. ඔහු එසේ පිළිතුරු දෙන්නේ නැති නම්, නඩුව ඔහුගේ සහභාගිත්වයෙන් තොරව ද ඉදිරියට යනු ඇත. එමගින් අධිකරණය විසින් ඔහුට විරුද්ධව අපගේ නඩුවේ ශක්තිය සලකා බලනු ඇත.

## මෙවැනි නඩුවක නීතිමය ක්‍රියාමාර්ගය කුමක්ද?

මේ වන විට, නඩුවේ නොතීසි ගෝඨාභය රාජපක්ෂ ට ලැබී ඇත. ඔහු දැන් මෙම නඩුවේ චෝදනා වලට පිළිතුරු දිය යුතු අතර, ඔහු වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීමට නීතිඥවරයෙක් රඳවා ගත යුතුයි. නඩුව ඉදිරියට ගියහොත්, නඩුවේ පාර්ශවයන් දෙදෙනාටම සාක්ෂිකරුවන්ගෙන් ප්‍රකාශ ගැනීමටද, එකිනෙකාගෙන් සාක්ෂි ලබා ගැනීමට ද අවස්ථාව උදා වනු ඇත. අන්තිමේදී මෙම නඩුව විභාගයක් කර ගිය හැකි අතර, එවිට විනිශ්චයකාරයෙකු ඉදිරියේ හෝ ජූරියක් ඉදිරියේ, සාක්ෂිකරුවන්, විද්වතුන් හා ඇගේම සාක්ෂි මගින් නඩුවේ සඳහන් චෝදනා, පැමිණිලිකාරිය ඔප්පු කල යුතු වේ.

## මෙම නඩුවෙන් සාපරාධි සම්බාධක ඇති විය හැකිද?

නඩුවේ සඳහන් අපරාධ වලට ගෝඨාභය රාජපක්ෂ වග කිව යුතු බව විනිශ්චයකාරයෙකු හෝ ජූරියක් තීරණය කළහොත්, මෙම නඩුවෙන් මූල්‍යමය හානි ඇති වනු ඇත. අපරාධ නඩුවක සේ, මෙම නඩුවෙන් කිසිවෙකු සිර දඬුවමකට ලක් කළ නොහැක. එහෙත් අපේ බලාපොරොත්තුව වන්නේ, මෙම නඩුව සාර්ථක වුවහොත්, එහි ප්‍රතිපලයක් වශයෙන්, ලංකාවේ අපරාධ විමර්ශනයට ද එය උපකාරී වන බවත්, අවසානයේදී එම විමර්ශනය හේතුවෙන් සාපරාධි වගවීමක් ඇති වන බවත් ය.

## මෙම නඩුව හේතුවෙන් ලංකාවේ අධිකරණ පද්ධතිය තුල යුක්තිය ලබා ගැනීමට අපහසු වෙයි ද?

ලංකාවේ මාධ්‍යවේදීන්ට එල්ල වූ ප්‍රහාර වලට සාධාරණ ස්වාධීන නඩු පැවරීම් සඳහා අපි සම්පූර්ණයෙන්ම සහයෝගය පල කරනවා. එහෙත් අවාසනාවකට මෙන් මෙවැනි නඩු පැවරීම් සිදු වී නැත. ලංකාවේ මෙම නඩු පැවරීම් සිදු වූ දවසක, අපගේ මෙම නඩුව එයට කිසිම බාධාවක් නොවනු ඇත. ඊට හාත්පසින්ම, අපේ බලාපොරොත්තුව වන්නේ, ලසන්ත, කීත් නොයාර් සහ අනෙකුත් මාධ්‍යවේදීන්ට එල්ල වූ ප්‍රහාර සම්බන්ධයෙන් ලංකාවේ සිදුවන විමර්ශන සහ අනාගත නඩු පැවරීම් වලට මෙම නඩුව උපකාරී වනු ඇති බවය.

## වින්දිතයන්ට යුක්තිය ලබා දුන් මෙවැනි නඩු මීට පෙර ඇමරිකාවේ සාර්ථක වී ඇත්ද?

බොස්නියා, චිලේ, චීනය එල් සැල්වඩොර්, සෝමාලියා වැනි රටවල් සිදු වූ මානව හිමිකම් උල්ලංගන සම්බන්ධයෙන් යුක්තිය සහ වගවීම සඳහා මධ්‍යස්ථානය සාර්ථකව ඇමරිකාවේ නඩු පවරා ඇත. පහත සඳහන් නඩු, මෑතකදී සාර්ථකව අවසන් වුනු මෙවැනි උදාහරණ දෙකකි:

- 2012 දී සෝමාලියාවේ හිටපු අගමැති සහ ආරක්ෂක ඇමති ජෙනෙරල් අලි මොහමඩ් සමන්ටාර් ට එරෙහිව ගෙන ලද නඩුවේ,ඇමරිකානු අධිකරණයක් විසින් සෝමාලියාවේ වද හිංසා වලට ලක්වූ පුද්ගලයන්ට USD මිලියන 21 ක වන්දි මුදලක් ලබා දුන්නේය.1980 ගණන් වල අසංඛ්‍යාත සිවිල් වැසියන් අනීතික ඝාතන සහ වද හිංසා වලට ලක් කිරීම සමන්ටාර් ගේ පාලන කාලය තුල සිදු විය. මෙම නඩුව යනු සියඩ් බාර් රෙජීමය යටතේ සිදුවූ මානව හිමිකම් කඩ කිරීම් සම්බන්ධයෙන් සෝමාලි නිලධාරියෙකු වගකිව ප්‍රථම අවස්ථාවයි. අනීතික ඝාතන, වද හිංසා හෝ අනෙකුත් විශ්වීය වශයෙන් හඳුනා ගනු ලබන මානව හිමිකම් උල්ලංගනය කිරීම්වලින් විදෙස් නිලධාරීන්ට මුක්තිය නොලැබෙන බවට මෙම නඩුව පූර්වාදේශයක් විය.

- 2016 දී චිලේ රටේ ප්‍රසිද්ධ ගායකයෙක් වූ වික්ටර් ජාරා ඝාතනය කිරීමට ලියුටෙනන්ට් පෙද්‍රෝ බැරියෙන්ටෝස් නුනෙස් වග කිව යුතු බව ඇමරිකාවේ ජූරියක් විසින් තීරණය කරන ලදී. ජාරාගේ ඥාතීන් ට USD මිලියන 28ක වන්දි මුදලක් හිමි වුනි.1973 දී, සමාජ සාධාරණත්වය සම්බන්ධයෙන් විශේෂයෙන් සාකච්චා කල ජාරා සහ සිය ගණන් අනෙකුත් පුද්ගලයින්ද පිනෝචේ රෙජීමේ හමුදාව විසින් වද හිංසා වලට ලක් කොට ඝාතනය කරන ලදී. 2009 දී හිටපු ආරක්ෂක නිලධාරීන් විසින් තම නිහඬභාවය අවසන් කල අතර, එමගින් චිලේ වල නිලදාරීන් කිහිප දෙනෙකුට විරුද්ධ ව නඩු විභාග ආරම්භ කරන ලදී. එහෙත් මේ වන විට බැරියෙන්ටෝස් ඇමරිකාවේ වාසය කල නිසා, චිලේ වල අධිකරණ ක්‍රියාවලි වල ග්‍රහණයෙන් ඔහු මිදී සිටියේය. යුක්තිය සහ වගවීම සඳහා මධ්‍යස්ථානය ගොනු කරන ලැබූ නඩුව හේතුවෙන් සහ චිලේ වල කර ගෙන ගිය නඩු පැවරීම් නිසා, ජාරාගේ ඝාතනයට ආණ්ඩුවේ සම්බන්ධය තහවුරු වුනේය.

## <u>යුක්තිය සහ වගවීම සඳහා මධ්‍යස්ථානය (Centre for Justice and Accountability)</u>

යුක්තිය සහ වගවීම සඳහා මධ්‍යස්ථානය (CJA) යනු වධහිංසාව, යුද අපරාධ, මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වැලැක්වීමට නවීන නීතිමය කටයුතු තුලින් වගවීම පිළිබඳ ගෝලීය ජාලය ශක්තිමත් කරන, ප්‍රතිපත්ති, සංක්‍රාන්තික යුක්ති මූලෝපායන් හරහා ලෝකය පුරා විසුරුවා හැරීම සඳහා කැපවූ සැන් ෆ්රැන්සිස්කෝ හි පදනම් ව පිහිටා ඇති මානව හිමිකම් සංවිධානයකි.

වින්දිතයන් හා අත්වැල් බදිමින්, CJA විසින් විපතට පත් වූවන්ට යුක්තිය ඉටු කර ගැනීම සඳහා කටයුතු කර ඇති අතර සෝමාලියානු සියාඩ් බාරේ තන්ත්‍රයේ හිටපු ආරක්ෂක අමාත්‍යවරයාට එරෙහිව චිලී ක්‍රියාකරු සහ ගායක වික්ටර් ජාරා ඝාතනය කිරීම සහ සිරියාවේ අසාද් මිලිටරි පාලනය විසින් යුධ වාර්තාකාරිය වන මරී කොල්වින් ඉලක්ක කර ඝාතනය කිරීම සුවිශේෂී හා සාර්තක වූ අවස්ථාවන් ය. අපේ වෙබ් අඩවියට පිවිසෙන්න: [www.cja.org](http://www.cja.org).